**බලංගොඩ නගර සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 23 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 13 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**---------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 20 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු සියළු ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. | වත්කම් කළමනාකරණ වැඩසටහන (AMS) සඳහා සියළුම ස්ථාවර වත්කම් ඇතුලත් කිරීමට කටයුතු සම්පාදනය කර ඇති බවත්, ඊට අදාල තක්සේරු වාර්තා ලැබීමෙන් අනතුරුව ඒවා මූල්‍ය ප්‍රකාශවලට ගැලපීමට නියමිත බවත් දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වැයකර තිබූ රු. 735,086 ක් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගෙන තිබුණු රු. 111,209,828 ක ණය මුදල ප්‍රතිව්‍යුහගතකරණයේදී කපා හරින ලද රු. 54,128,411 ක පොළිය ණය ගිණුමට බැර කර තිබුණි. | ණය ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ 19 ක වටිනාකම වූ රු. 132,058 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල සියළු බැරකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ඉකුත් වර්ෂයට අදාල රු. 255,323 ක පුනරාවර්තන වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි. | ඉකුත් වර්ෂවලට අදාල ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි අතපසුවීම් වළක්වා ගනිමින් කටයුතු කරන බව දන්වමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් රු. 1,152,218 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාල බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේදී නිවැරදි කරන බව දන්වමි. |
| (උ) | සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම් රු. 130,899 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඌ) | 2020 ජනවාරි ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද රු. 7,000,000 ක් සමාලෝචිත වර්ෂයේ ආයෝජනයක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | වර්ෂයට අදාල ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (එ) | සමාලෝචිත වර්ෂය තුල මිළදී ගෙන තිබූ එකතුව රු. 1,415,086 ක් වූ යන්ත්‍ර හා උපකරණ සහ ලීබඩු හා සවිකිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වර්ෂය තුල මිලදීගත් සියළු ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඒ) | වසර 10 කට පෙර සිට ඉදිරියට එන රු. 596,080 ක සහ සමාලෝචිත වර්ෂයට අදාල රු. 86,270 ක අගරු චෙක්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අගරු චෙක්පත් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයට අදාල ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නගර සහා ආඥා පනතේ 154 (1) සහ 157 (6) (උ) වගන්ති | බලංගොඩ නගර සීමාවේ ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, පරිපාලනය කිරීම, අධීක්ෂණය කිරීම හා දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම සඳහා 2018 වර්ෂයේ දී පිළියෙල කර තිබූ අතුරු ව්‍යවස්ථාව අනුමත කර ගැනීමට 2019 දෙසැම්බර් 31 වනවිටත් කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාව අනුමත කරගෙන ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ප්‍රචාරණ දැන්වීම් අතුරු ව්‍යවස්ථා දිගින් දිගටම සංශෝධනය කිරීම නිසා යම් ප්‍රමාදයක් සිදුවුණ බවත්, අවසන් සංශෝධන කෙටුම්පත නැවතත් අනුමැතියට යොමුකිරීමට කටයුතු කරමින් පවතින බවත් දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 1,604,413 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,743,028 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 8,745,000 | 8,149,957 | 7,356,497 | 3,021,434 | 8,590,000 | 8,991,122 | 7,993,892 | 4,012,406 |
| කුලී | 31,225,000 | 31,332,843 | 30,942,713 | 1,032,891 | 24,360,000 | 28,088,669 | 28,144,527 | 804,356 |
| බලපත්‍ර ගාස්තු | 4,710,000 | 4,406,843 | 4,378,290 | - | 4,000,000 | 3,804,125 | 3,804,125 | - |
| වෙනත් ආදායම් | 42,950,000 | 30,774,124 | 64,446,547 | 12,979,122 | 28,310,000 | 24,356,748 | 23,745,450 | 160,164 |
| | 87,630,000 | 74,663,767 | 107,124,047 | 17,033,447 | 65,260,000 | 65,240,664 | 63,687,994 | 4,976,926 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂ වලට අදාලව හිඟව තිබූ වරිපනම් ගාස්තු රු. 2,277,995 ක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර හිඟ වරිපනම් ගාස්තු සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක්ද සකස් කර නොතිබුණි. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා විශේෂ ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කළ බවත්, දැනට ක්‍රියාත්මක පරිගණක වැඩසටහන මඟින් කාල විශ්ලේෂණ වාර්තාවක් ලබා ගැනීමට පහසුකම් නොමැති බවත් දන්වමි. |

**2.2.3** **කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂ සඳහා හිඟව තිබූ කුලී හා ගාස්තු රු. 354,444 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | බස් නැවතුම්පල කඩකාමර වලින් අයවිය යුතු රු. 105,300 ක් අයකර ගැනීම සඳහා මේ වනවිට අධිකරණයේ නඩු පවරා ඇති අතර, ඉතිරි හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.4** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 ජනවාරි සිට 2019 ජුනි දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 20,609,670 ක් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම කාලසීමාවට අයත් මුද්දර ගාස්තු ලබා ගැනීමට අදාල උපලේඛන මේ වනවිට පළාත් සභාවට යොමුකර ඇති බව දන්වමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, මහජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකල යුතු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය වසරකට ටොන් 504 ක් පමණ එක්රැස් වන අතර නාය ගිය කසල කන්ද අසල වූ විවෘත භූමියක ගොඩගසා තිබුණු මෙට්‍රික් ටොන් 1057 ක් පමණ වූ ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ඝන අපද්‍රව්‍ය තොගය පරිසරයට හිතකර ලෙස බැහැර කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුවේ. | මෙම කසළ තොගය අහිතකර නොවන පරිදි බැහැර කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් සඳහා උපදෙස් ලබා ගැනීමට මහ සභාවට ඉදිරිපත් කිරීමටත් සභාවෙන් ලැබෙන තීරණය අනුව මෙම කසළ තොගය ඉවත් කිරීමට පියවර ගැනීමටත් ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂවලට අදාළ එකතුව රු. 807,973 ක් වූ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් නිරවුල් කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් දායක මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මියගිය සේවකයින්ට අදාල දායක මුදල් ඉවත්කොට ඉතිරි ශේෂයන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවීම් සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | **සේවක පුරප්පාඩු** | | |
| (i) | ලේකම් තනතුර 2001 ජුලි සිට පුරප්පාඩු වී තිබූ අතර රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ නිළධාරියෙකු 2016 සැප්තැම්බර් සිට ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර තිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ පිළිබඳ පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත කාර්තුමය වශයෙන් දැනුවත් කර ඇති බව දන්වමි. |
| (ii) | මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරක්, පුස්තකාලයාධිපති තනතුරු 02 ක්, කළමනාකරණ සහකාර තනතුරක්, ආදායම් පරීක්ෂක තනතුරක්, පෙර පාසල් ගුරු තනතුරු 02 ක්, රියදුරු තනතුරු 02 ක් හා ඖෂධ සංයෝජක තනතුරක පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම පුරප්පාඩු පිළිබඳ නිරන්තරයෙන් පත්වීම් නිලධාරියා දැනුවත් කර ඇති බව දන්වමි. |
| (ආ) | **සේවක ණය** | | |
| | 2018 වර්ෂයේදී සේවය හැරගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු. 104,517 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ණය අයකර ගැනීම සඳහා නෛතික පියවර ගැනීමට කටයුතු කර ඇති බව දන්වමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බලංගොඩ නගර සභා හා බලංගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ පවතින පවුල් 119 ක් සම්බන්ධයෙන් සීමා නිර්ණය සිදුකර නොතිබීමෙන් එම වරිපනම් ඒකක 119 ට අදාළව රු. 191,289 ක් වූ වරිපනම් අයකිරීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි. | සීමා නිර්ණය පිළිබඳ ගැටළුව විසඳා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සීමා නිර්ණය පිළිබඳ ඉදිරි කටයුතු සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර වාර්තාවක් ලබාදීමට අවශ්‍ය කටයුතු සඳහා ආදායම් පරීක්ෂකට යොමුකර ඇති බව දන්වමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

--------------------------------

**වත්කම් ලේඛනගත නොකිරීම**

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු. 451,950,444 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උප ලේඛන ද වටිනාකම රු. 14,721,402 ක් වූ අතැති තොග හා මුදල් මාරු ගිණුම සඳහා විස්තරාත්මක උප ලේඛන ද යාවත්කාලීන කර නොතිබුණි. | වත්කම් ලේඛන හා විස්තරාත්මක උපලේඛන යාවත්කාලීනව නඩත්තු කළ යුතුවේ. | සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බවත්, ඒවා තක්සේරු කිරීමෙන් අනතුරුව වත්කම් කළමනාකරණ වැඩසටහනට ඇතුලත් කරන බවත් දන්වමි. |

**3.6 ප්‍රසම්පාදනය**

---------------

**කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොන්ත්‍රාත් වටිනාකම රු. 478,000 ක් වූ බස්නැවතුම්පළ සිවිලිම ඉදිකිරීම පිළිබඳව විධිමත් පරිදි ලංසු ලියවිලි නිකුත් කිරීමට කටයුතු කර නොතිබීමෙන් ඉදිරිපත් කළ ලංසු පසුව නැවත සංශෝධනය කිරීමට සිදුවී තිබුණි. ඒ හේතුවෙන් සියළුම ලංසුකරුවන් ඇගයීම් කර සාරානුකූලව ප්‍රතිචාර දැක්වූ ලංසුකරු තෝරා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | මිල ගණන් කැඳවීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී ඇස්තමේන්තු අංක 01 සිට 09 දක්වා පමණක් මුලින් සකස් කල බවත්, පසුව අයිතම 10 සිට 20 දක්වා සංශෝධනයන් ඇතිව නැවත ඉදිරිපත් කල බවත්, සම්පූර්ණ ඇස්තමේන්තු මිල ගණන් කැඳවූ තරඟකාරී පාර්ශව වෙත යොමුකල බැවින් ලංසුකරුවන්ට අගතියක් සිදුව නැති බවත් දන්වමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**නොවිසඳී ඇති නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් බලංගොඩ තානායමේ, අලෙවි කිරීම සඳහා 2016 මැයි 21 වෙනි වෙසක් පුර පසළොස්වක පෝය දිනයේදී රට බීම මිලි ලීටර් 163,110 ක් බලපත්‍ර කොන්දේසිවලට පටහැනිව තබා ගැනීම මත රත්නපුර සහකාර සුරාබදු කොමසාරිස් විසින් 2016 අගෝස්තු 08 දින නියම කළ රු. 1,515,000 ක දඩ මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමේ පදනම මත සභාව විසින් ගෙවා තිබුණි. දඩ මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා විත්තිකරුවන් තිදෙනෙකුට එරෙහිව නඩු පවරා තිබූ නමුත් සහකාර සුරාබදු කොමසාරිස්ගේ චෝදනා පත්‍රයේ සඳහන් වෙසක් මාසයේ පුර පසළොස්වක පෝය දිනයේදී මත්පැන් විකිණීම යන චෝදනාද ඇතුලත්ව අනෙකුත් චෝදනා නඩුවේ චෝදනා ලෙස ඇතුලත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | අදාල සියළු චෝදනා නඩුවේ චෝදනා ලෙස ගොනුකර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පෝය දින මත්පැන් අලෙවි කිරීම නිසා මෙහි බලපත්‍රය අවලංගු කරන බව සුරාබදු දෙපාර්තමේන්තුව දන්වා තිබූ නිසා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින්ට එරෙහිව නීතිමය කටයුතු කර අයකර ගැනීමේ පදනම මත පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය මත සහා අරමුදල් මඟින් මෙම දඩ මුදල වාරික 09 කින් ගෙවා ඇති බව දන්වමි. |
| (ආ) | ඉකුත් වර්ෂ වල සිට ඉදිරියට ගෙන එනු ලැබූ රු. 9,303,601 ක් වූ මුදල් මාරු ගිණුමේ ශේෂය නිරවුල් කර නොතිබුණි. | මුදල් මාරු ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | තානායම් ගාස්තු හා තානායම් ණය ගැතියන් 98 ක ගෙන් වර්ෂ 07 කට වැඩි කාලයක සිට අයකරගත යුතු රු. 953,745 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් හා ණයගැති ශේෂ අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | තැන්පත් ගිණුමේ පවතින සේවා ගාස්තු වලින් ණයගැති ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් තානායම් ගාස්තු වෙනුවෙන් පවතින හිඟ ශේෂයන් ද කඩිනමින් නිරවුල් කිරීමට අපේක්ෂා කරන බවත් දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රු. 10,100 ක මාසික කුලියකට බදු දෙන ලද කඩකාමර 02 ක් රු. 35,000 කට අතුරු බදු දී තිබුණි. ඊට අමතරව මහජන පොලෙහි කඩකාමර බදු දීමට අදාල ගිවිසුමට පටහැනිව කඩකාමර 07 ක් අතුරු බදු දී තිබුණද ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර ඊට අදාල වාර්තාව අවශ්‍ය උපදෙස් ලබා ගැනීම පිණිස සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකර ඇති බවත් ලැබෙන උපදෙස් වලට අනුව ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බවත් දන්වමි. |
| (ඉ) | 2016 මාර්තු 15 දින DMS/D/0217 දරන කමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මඟින් බලංගොඩ නගර සභාවේ ගිනි නිවීමේ ඒකකය සඳහා කාර්ය මණ්ඩල තනතුරු 20 ක් අනුමත කර තිබු නමුත් එම තනතුරු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම හේතුවෙන් ගිනි නිවීමේ ඒකකය විධිමත්ව ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි. | කාර්යය මණ්ඩල බඳවාගෙන ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුවේ. | ගිනි නිවීමේ කාර්යය මණ්ඩල සඳහා බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟිනි. මේ පිළිබඳ 2019 නොවැම්බර් 04 දිනැතිව පත්වීම් බලධාරියාට දන්වා යවා ඇති බැවින් ඒ අනුව ක්‍රියාමාර්ග ගනු ඇතැයි අපේක්ෂා කරන බව දන්වමි. |